#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina

යම් පුවතක් පළ කිරීමේදී එයට පාදක කොටගත් මූලාශ්‍රයන් සඳහන් කිරීම ඔස්සේ එම ලිපියට වඩාත් වැඩි විශ්වාසනීයත්වයක් ලැබෙනා බව නොකිවමනායි. එසේ වුවත් යම් යම් සංවේදී කරුණු සම්බන්ධයේදී මූලාශ්‍ර පුද්ගලයින්ගේ අවසරය නොමැති විටක, තම මූලාශ්‍රයන් ආරක්ෂා කිරීම ජනමාධ්‍යවේදියෙකුගේ ආචාර ධාර්මික වගකීමක් බවද අවධාරණය කළ යුතුවේ.

කෙසේ වුවත් මෙහි තවත් පැත්තක් ඇත. යම් ජනමාධ්‍යවේදියෙකුට හෝ පුවත්පතකට නොමඟ යවන සුළු, කරුණු විකෘති කළ හෝ සම්පූර්ණයෙන්ම සාවද්‍ය පුවතක් ජනගත කිරීම සඳහාද ඉහත මූලාශ්‍රයන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය හා ආචාර ධර්මය දඩමීමා කරගැනීමට හැක.

එනිසා, මූලාශ්‍ර පුද්ගලයින්ගේ කැමැත්ත ඇති, එමෙන්ම හැකියාව ඇති සෑම අවස්ථාවකම මූලාශ්‍ර සඳහන් කිරීම වඩාත් යෝග්‍ය නොවේදැයි යළිත් අසමු.